## 90 – සිහිවෙනවා සිහිවෙනවා

සිහිවෙනවා සිහිවෙනවා නිතර දෙවේලේ මට සිහිවෙනවා
ඔබ ගැනැ ඔබේ පුත් ජේසු තුමා කියාපු විසිතුරු විස්මිත කථා
සගවැසි පියාණනේ, ඔබ මට සිහිවෙනවා

පියාගේ වග තුග මට හඳුනා දෙන්න හිතා ඔබ කීව කථා
ජේසුනි කොතෙකුත් සිහිවෙනවා සග වැසි පියාව මට පෙනෙනා

බාල අකීකරු පුතා එදා පියාව අත්හැර දමා ගියා
උපමාවක් ලෙසැ මා සඳහා කීව වගේ ඒ මට හැඟෙනා

පියාව අත් හැරැ දමා ගියේ ඈත්වෙලා දුර රටකට නේ
ඒ මේ සසරේ දුර කතරේ තනි මට හොඳ හැටි වැටැහෙන්නේ

පිතාට වුණු දේ මටත් වුණේ මොනවා හොයා මා මෙහි ඉන්නේ
ඉසුරු කියා මා මෙතෙක් අනේ සෙව්වේ වසුරුයි මගේ පියේ

පුතා එදා හොඳ සිහිය ලබා පියාද ගෙදර ද සිහිකෙරුවා
ඇයි යන්නේ මා මෙහි මැරිලා නැගිට්ටම් යම් මම් පියා සොයා

මේ සසරේ මම මිදී එදා එම් ද පියේ ඔබේ වහල සොයා
මා එනතුරු ඔබ සුසුම් හෙලා ඇස් දිගු කැරගෙන සිටිති බලා

කවදා ඔබ මගෙ බෙල්ල බදා හාදු දිදී පිළිගන්නේ මා
මුදුවක් ඇඟිල්ලේ මගේ දමා මගුල් ඇඳුම මට පොරවාලා

සාදාකාල මංගල මෙසේ බොජුනට මා ලංකැරැ ගන්නේ
"නොදකින" දේ මා අදහන්නේ, අදහන දේ මා දැකැගන්නේ